කවිය පිළිබඳ ප්‍රගතිශීලී විචාරයක් අවශ්‍යයයි

"හිතාදර දළුඹුවනි" කාව්‍ය සංග්‍රහය 2018 වසරේ දී ගොඩගේ අත්පිටපත් තරගාවලියේ දී ප්‍රශස්තතම කාව්‍ය අත්පිටපතට හිමි සම්මානය දිනාගත්තේය. එය දිනාගැනීමත් සමග චින්තක සමන් හේරත් කවියා පිළිබඳව සාහිත්‍ය සමාජය තුළ කතාබහක් ඇති විය. ඉන් පෙර ද ඔහු කවියෙක් ලෙස සමාජ මාධ්‍ය අවකාශ තුළ සිය කවිය සහෘදයාට සමීප කරමින් සිටියේය.

"වැහි වැටෙන දවස්" කාව්‍ය කෘතිය 2020 වසරේ දී ඔහු ප්‍රකාශයට පත් කළේය. එය රාජ්‍ය සාහිත්‍ය සම්මාන උළෙලේ අවසන් වටය නියෝජනය කළේය. එපමණක් නොව, ගොඩගේ සම්මානය සඳහා ද නිර්දේශ විය. ඔහුගේ නවතම කාව්‍ය කෘතිය "මා තුළම වැඩුණේය අන් යමෙකු" කෘතිය පසුගිය වසරේ දී පාඨකයා අතට පත්වෙන්නේ සන්ථව ප්‍රකාශනයක් ලෙසිනි.

චින්තක සමන් හේරත් සමඟ කළ කතාබහ අප මෙම ලිපිය ඔස්සේ ඔබට ගෙන එන්නෙමු.

ප ඔබේ කවි පුවත්පත්වල පළ වෙනවා අපි දුටුවා. කවි පොතක් කරන්න පෙර පුවත්පතකට කවි යොමු කිරීම තුළින් කවියෙක්ට ප්‍රයෝජනයක් තියෙනව ද?

පුවත්පතක කවියක් පළවීමෙන් ඇතිවෙන සතුට, උත්තේජනය ආධුනික කවියෙකුට වචනයෙන් විස්තර කළ නොහැකි විසල් හැඟීමක්. ඒ හැඟීම ඒ ආකාරයෙන්ම මටත් දැනිලා තියෙනවා. අපි පුවත්වත්වලට වැඩි වශයෙන් කවි යොමුකරපු එකවානුවේ ඒ ඒ කවි පිටු සංස්කාරකවරුන් අපේ කාව්‍ය ක්ෂේත්‍රයේ ජ්‍යෙෂ්ඨයන්. ඔවුන්ගේ ඇසුර පවා අපට ලැබුණේ ඒ නිර්මාණ හරහා විවර වූ ඉඩ හසර නිසාවෙන්. මගේ දෙවැනි කාව්‍ය සංග්‍රහයට මම කවි තෝරාගත්තේ වසර කීපයක කාලයක් පුවත්පත්වල කවි පිටුවල හොඳම කවි ලෙස තේරුණු එම කවි එකතු කරලා. ඒ පොත ඒ වසරේ රාජ්‍ය සම්මාන අවසන් වටයටත් නිර්දේශ වුනා. සම්මාන නිර්දේශවීම්, පුවත්පත්වල හොඳම කවි ලෙස කවි තෝරාගැනීම් පිළිබඳ කෙනෙකුට විකල්ප අදහස් තියෙන්නත් පුළුවන්. නමුත් මගේ අත්දැකීම් අනුවනම් කවි පොතක් පළ කරන්න පෙර පුවත්පත්වලට කවි යොමුකිරීම කෙනෙක්ට නොවැදගත් දෙයක් නොවෙයි.

ප ඔබේ කවිය ක්‍රමානුකූලව වර්ධනය වූවක්. පළමු පොතේ සිට අවසානයට ප්‍රකාශයට පත් වූ පොත දක්වා ඔබේ අත්දැකීම් පරාසය පුළුල් කර ගැනීමට ඔබට බලපෑව යමක් තියෙනව ද?

මගේ නම් ලිවීමත්, කියවීමත් කියන දෙකම එකිනෙකට සමාන්තරව සිදුවෙන දෙයක්. මම නොකියවන කාලවල මම ලියන්නෙත් නැහැ. එවැනි නිද්‍රාශීලී කාලවකවානු ජීවිතයේ එළැඹෙනවා. දැන් පසුකරමින් සිටින්නෙත් එවැනි කාලයක්. මගේ කවියේ යම් වර්ධනයක් ඇතැයි ඔබට හැගෙනවානම් ඊට හේතුකාරක වෙන්නට ඇත්තේ ඒ කියවීම සහ ලිවීම වෙන්න ඇති. අත්දැකීම් පරාසය පුළුල් කරගැනීමට

බලපෑව යමක් .... යනුවෙන් ඔබ අහද්දී මතක් කරන්න කැමතියි E. L. Doctorow ගේ එක්තරා ප්‍රකාශයක්. The three most important documents a free society gives are a birth certificate, a passport, and a library card යනුවෙන් ඔහු නිදහස් සමාජයක පුද්ගලයෙකු සතු වැදගත් ලියවිලි තුනක් හඳුන්වනවා. ඒ වැදගත් ලියවිලි තුනෙන් පුස්තකාල කාඩ්පත හැමදාම මගේ සාක්කුවක තිබුණු දෙයක්. ඊට අමතරව මම දිවයිනේ විවිධ ප්‍රදේශවල රාජකාරි කටයුතු වෙනුවෙන් යන එන, නතරවෙන, විවිධාකාර පුද්ගල කණ්ඩායම් එක්ක වැඩ කරන කෙනෙක්. ඒ සියලු අත්දැකීම් ඊට බලපාන්න ඇති.

ප සමාජ ප්‍රශ්න කවිය තුළින් ඉදිරිපත් කිරීමෙන් සමාජයට, පාඨකයාට යම් සාධනීය බලපෑමක් කරන්න පුළුවන් ද?

කවිය පිළිබඳව පළ වී ඇති පෙර'පර දෙදිග කාව්‍ය විචාරක නිර්වචන සලකා බැලීමේ දී හැඟෙන එක් මූලික කාරණාවක් තමයි 'කවිය අපූර්ව වූත් හෘදයාංගම වූත් කේන්ද්‍රිය සාහිත්‍යාංගයක්' කියන එක. එහිදී කවියා අපූර්ව වස්තු නිර්මාණකරුවෙකු ලෙස හඳුන්වා තිබෙනවා. නිර්මාණයකින් අප හදවත්වල වින්දනයක් ජනිත කරන්නේ හෘදයාංගම විදිහට. කවියේ සමාජ දේශපාලනික බරක් තිබිය යුතුයි තමයි. නමුත් මම ඉහත කියපු 'සියුම් හෘදයාංගම කේන්ද්‍රීය සාහිත්‍යාංගය' කියන කාරණාව ගැනත් මූලිකව විශ්වාස කරනවා. නැතිනම් කවියක මනුෂ්‍ය ජීවිතය පිළිබඳ ඇතැම් සියුම් කරුණා මග හැරෙනවායැයි මම කල්පනා කරනවා. අපේ රටේ දේශපාලනික නොවී හිඳීමත් එක්තරා දේශපාලනයක්. යම් සාධනීය බලපෑමක් කියන දේ මත පදනම්ව සියල්ල දේශපාලනික ඇහැකින් දකින්න උවමනා බවක් හෝ සියල්ල දේශපාලන නිමැවුම් විය යුතු බවක් මම විශ්වාස කරන්නේ නැහැ.

ඒ ඒ මොහොතේ සමාජ ප්‍රශ්නවලට අපි දක්වන ඇතැම් සංවේදීභාවන් පසු කලෙක එම මැදිහත්වීම් දිහා වෙනත් ඇසකින් බලන්නට පවා හේතුකාරණා යෙදෙනවා. උදාහරණයක් විදිහට ජාතික වීරවරයෙක් ලෙස සැලකෙන ටිබෙට් ජාතික එස් මහින්ද හාමුදුරුවේ එදා "සිංහලයන්ගේ ඇස්ගෙඩිවලට හෙන ගැහිලද" කියලා අහපු දේ අද වෙනත් ආකාරයකින් සිදුකරන පිරිසක් ඉන්නවා. ඉන් සමාජයක් ලෙස අපි විශාල ගැටලු අර්බුද රාශියකට මුහුණ දෙනවා. ඔබ අහපු අනෙක් පැනයටත් මහින්ද හාමුදුරුවන්ගේ උදාහරණයම ගන්න පුළුවන්. එදා නිදහස වෙනුවෙන් උන් වහන්සේ නැගූ හඬෙයි ප්‍රමාණයට ඇත්තටම සමාජය අවදිවීමක් සිදුවූයේ නැහැ. අපි සටනකින්, අරගලකින් ලබාගත යුතු නිදහසක් අපේක්ෂා කළේ නැහැ. දැන් ඒ සටන් පාඨ ඇවිළෙන්නේ වෙනත් ආකාරයකින්. ඒ නිසා නිර්මාණයක සමාජ සංවේදීතාව කියන එක සාපේක්ෂ දෙයක්. පාඨකයාට බලපෑමක් නිර්මාණ හරහා කරන්න පුළුවන්. හැබැයි එහි සාධනීය නිෂේධනීයබව ගැන සහතිකය ලබාගත හැක්කේ ඒ මොහොතේ සමාජයක් නිර්මාණය වෙන ආකාරයෙන්ම නොවෙයි.

ප ඔබේ කාව්‍යමය භාෂාව දිනෙන් දින දියුණු වෙන බව ඔබේ කවි අධ්‍යයනය කිරීමේ දී අපට පෙනී යනවා. කවියක් වඩා සාර්ථක වෙන්නේ සරල සුගම භාෂාවක් උපයුක්ත කරගැනීමෙන් ද?

නිර්මාණකරුවෙක්ගේ, කවියෙක්ගේ ප්‍රධාන මෙවලම භාෂාව වුවත්, ඔහු එම භාෂාව උපයෝගී කරගන්න ආකාරය නිර්මාණයේ දී ඉතා වැදගත්. කවියෙකු විසින් ඔහු මතු කිරීමට උත්සාහ දරන අනුභූතියට, ප්‍රස්තුතයට ජීවයක් ලැබෙන්නේ එම භාෂාව ඔහු මෙල්ල කරගන්නා, එකග කරගන්නා ප්‍රමාණය අනුව. මම එය කොතෙක් දුරට සාර්ථක කරගෙන ද කියන එක මට කියන්න බැහැ. ඒක නොනවතින ක්‍රියාවලියක්. නිර්මාණකරුවා නිතරම භාෂාව සමග සටන් වදිමින් සිටින කෙනෙක්. පැරණි සම්භාව්‍ය සාහිත්‍යයේ භාෂාව වගේම නවීන ව්‍යවහාර භාෂාවත් කවියකු විසින් ප්‍රගුණ කළ යුත්තක්. ඒ නිසා කවියක දී උපයෝගී කරගත යුතු භාෂාව සරල සුගම සියුම් භාෂාවක් පමණක්ම විය යුතු යැයි කියන්නම බැහැ. කවියේ කාව්‍යානුභූතියම තමයි ඊට උවමනා භාෂාව, රිද්මය, සංක්ෂිප්ත බව යනාදී කරුණු ඒ ඒ මොහොත තුළ ඉල්ලා සිටින්නේ.

ප කවිය පිළිබඳව ඇති සමාජ, සාහිත්‍ය කතිකාව පිළිබඳව කවියෙක් ලෙස ඔබ සෑහීමකට පත්වෙනවා ද?

කවිය පිළිබඳ උනන්දුවක්, කතිකාවක් මේ මොහොතේ පෙනෙන්නට තිබුණත් එහි තරමක් ව්‍යාජ බවකුත් තියෙනවා. සමාජ මාධ්‍ය පදනම් කරගෙනත්, ප්‍රකාශකයින්ගේ ප්‍රචාරණ ක්‍රමයක් විදිහටත් ඒක ගොඩනැගෙමින් තිබෙනවා. ඉන් පරිභාහිරව ඇතිවෙන කතිකාවන් ඉතා අඩුයි වගේම පෙර තී සංවාදයන් තරම් ඒවා ප්‍රබලත් නැහැ. ඒ වෙනුවෙන් මැදිහත්ව, වැඩ කළ හැකි අය පවා සිටින්නේ විවිධ කලකිරීම්වලට ලක්ව, නැතිනම් උදාසීනව. එසේ

තිබියදීත් තම උපරිම ධාරිතාවයෙන් අවංකව පොදු මැදිහත්වීමක් සිදුකරන සුළු පිරිසක් අතරින් පතර සිටින නිසා අපිට කවිය ගැන තියෙන ඇල්ම තවදුරටත් එසේම පවත්වාගෙන යන්න පුළුවන්.

ප පාඨක සහෘදයාට කවිය වඩා සමීප කිරීම කෙරෙහි වඩාත් බලපාන්නේ කවියෙහි කුමන අංගය ද?

මම නම් හිතනවා ඒ කවියක විචිත්‍රවත් බව කියලා. ආර්යවංශ රණවීර චීන කවි පරිවර්තන පොතෙහි පෙරවදනෙහි චීන කවීන්, කවියේ විචිත්‍රත්වය පවත්වාගෙන යාම වෙනුවෙන් යම් ප්‍රස්තුතයක් තෝරාගැනීමේ දී දක්වන සැලකිල්ල ගැන සඳහන් කොට තිබෙනවා. ඒ විචිත්‍රත්වය, කවියේ, දේශපාලනය ද, සමාජ මැදිහත්වීම ද, බුද්ධිවාදී බව ද එකී නොකී සියල්ලම අභිබවා යන්නක්. ඉන් අදහස් කරන්නේ භාවාතිශව, එකවර තිගැස්මකට ලක්වෙන කාව්‍ය ධාරාවක් පිළිබඳව නොවෙයි. ඒ විචිත්‍රත්වය ඇතිවන්නේ තරමක් පුහුණු පාඨකයෙක් තුළ. ඒක වචනයකින් විස්තර කළ නොහැකි හැඟීමක්.

ප කවිය පිළිබඳව විචාරක භූමිකාවෙන් 'මා තුළම වැඩුණේ ද අන් යමෙකු' පොතට සාධාරණයක් ඉටු වුණා ද?

ඇත්තටම මට ඒ ගැන විශේෂ උනන්දුවක් නැහැ. පළමු කවි පොතෙහි හෝ අවසන් කවි පොතෙහි එක් පිටපතක්වත් දැන් මගේ ළඟ නැහැ. විචාරක, පාඨක භූමිකාවෙන් සාධාරණයන් ඉටුකරගැනීමේ අපේක්ෂාවෙන් සිදුවෙන නිර්මාණ කාර්යයක් ගැන විශ්වාසයක් තබන්නට බැහැ. මගේ පැරණි බොහෝ නිර්මාණ ගැන ඇතැම්විට මට පවා දැන් තෘප්තියක් නැහැ. මිනිස්සු සිතන පතන විදිහ වෙනස්. ඒ නිසා ඒ මගේ පෞද්ගලික අදහසක්. කවිය පිළිබඳ විචාර භූමිකාව පොදුවේ නොවැදගත්යැයි මා ඉන් අදහස් කරන්නේ නැහැ. කවිය පිළිබඳව ප්‍රගතිශීලී විචාර කලාවක් තිබිය යුතුයි. සමහර විට විචාරය කිරීමට තරම් ගුණාත්මක නිර්මාණ බිහිවීම සෙමෙන් හා අඩුවෙන් සිදුවීමත් එවැනි විචාරකලාවක් නොපෙනීමට හේතුවක් වෙලා ඇති. වැඩි වශයෙන් දැන් පෙනෙන්නට තිබෙන්නේ පොත ගැන යම් හැඳින්වීමක් මිස ඒ පිළිබඳව මැදහත්ව සිදුකළ විචාරයක් නොවෙයි. හැබැයි මේ සියලු විචාර ධාරාවලට මගහැරෙමින්, විචාර සීමාවන්ගෙන් පිටත අවකාශයෙත් වර්තමානයේ ඉතාම දක්ෂ කවීන්, නිර්මාණකරුවන් බිහිවෙමින් සිටිනවා.

■ නවෝද්‍යා ජයවික්‍රම